**ශීර්ෂය 431 පොල්, කිතුල් හා තල්වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍යඅමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

පොල්, කිතුල් හා තල්වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍යඅමාත්‍යාංශයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොල්, කිතුල් හා තල්වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2021දෙසැම්බර් 31 දිනට පොල්, කිතුල් හා තල්වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.128,653,500ක ශුද්ධ ප්‍රතිපාදනවලින්, සමාලෝචිත වර්ෂය තුළදී රු.48,651,121ක මුදලක් එනම් ශුද්ධ ප්‍රතිපාදිත මුදලින් සියයට 20 ක සිට සහ සියයට 85 ක් අතර පරාසයක ප්‍රතිශතයක් උපයෝජනයකර නොතිබුණි. | මෙම අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන වේ. අමාත්‍යාංශය ආරම්භක අවධිය බැවින් අනුමත කාර්ය මණ්ඩලය 2020 දෙසැම්බර් මාසය වන විට සම්පූර්ණ වි නොතිබිණි. එබැවින් මෙහෙයුම් වියදම් අඩුවී ඇත. | සලසාගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.1,172,630,000ක ශුද්ධ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.463,241,357ක මුදලක් එනම් ශුද්ධ ප්‍රතිපාදිත මුදලින් සියයට 13ක සිට සියයට 100ක් දක්වා අතර පරාසයක් ඉතිරිව පැවතිණි. | අමාත්‍යාංශය අලුතින් ආරම්භ කරන ලද බැවින් යන්ත්‍ර උපකරණ, ගොඩනැගිලි, වාහන වැඩි දියුණු කිරීම වෙනුවෙන් වියදම් දැරීම සිදු නොවුණි. එමෙන්ම 2020 වර්ෂය තුළ පැවති කොවිඩ් 19 රෝගී තත්ත්වය හේතුවෙන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සිදුවූ බැවින් එම වැය විෂයන් වල වියදම අඩුවී ඇත. | ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය සඳහා වසර ආරම්භයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පුරන් කුඹුරුවල වාණිජමය පරමාර්ථයෙන් පොල් වගා කිරීම, කිතුල් නිෂ්පාදන දිරිගැන්වීම සහ දේශීය තල් කර්මාන්තය විවිධාංගිකරණය කිරීම යන සංවර්ධන ව්‍යාපෘති 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.400,000,000 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.244,024,218ක් හෙවත් | අයවැය යෝජනාවෙන් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත "දිවයිනේපවතින පුරන් කුඹුරු එලදායි වානිජ ඒකක බවට පත්කිරීමේ ව්‍යාපෘතිය" සඳහා රු.මිලියන 248 ක් වෙන්විය. මෙම ව්‍යාපෘතියේ රු.මිලියන 148 ක් නැවත 2021 සැප්තැම්බර් 15 දින පවරා දී | පරිපූරක වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය සඳහා වසර ආරම්භයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |

සියයට 82 ක ඉතිරියක් පැවතිණි. ඒ අනුව අදාළ කාර්යයන් සැළසුම් කළ පරිදි වර්ෂය තුළදී අවසන් කර ගැනීමට නොහැකිව තිබුණි.

ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් ඉල්ලුම් පත්‍ර ගෙන්වා ගෙන මූලික ඉඩම් පරීක්ෂණ සිදු කර ඇති අතර පොල්වගාවට අනුමැතිය ලබාගැනීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණ ද එම ඉඩම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දී නැත.

කිතුල් නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා මෙම වැය විෂය යටතේ දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රතිපාදන වෙන් කර තිබුණි.අක් මුදල් නොලැබීම හේතුවෙන් රු.මිලියන 44.3 අතැති බිල්පත් ඉතිරි වී තිබුණි.එබැවින් මූල්‍ය ප්‍රගතිය අඩු මට්ටමක පැවතිණි.

දේශිය තල් කර්මාන්තය සඳහා වෙන්වූ රු.මිලියන 200 ක මුදලින් තල් නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර වල පැවති ගැටලු හේතුවෙන් හා ඉඩම් ගැටලු හේතුවෙන් ප්‍රතිපාදන වියදම් දැරීම සීමාවී ඇත.

## 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| 2021 නොවැම්බර් 21 දිනැති අංක 2021 /03 දරන රාජ්‍යගිණුම්මාර්ගෝප දේශ චක්‍රලේඛයේ 7.6 ඡේදය | 1,910,325 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ හරස් සටහන් මගින් ලැබීම් සහ ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවද හරස් සටහන් මගින් ගෙවීම් ඇතුළත් කර නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂයන් සටහන් කිරීමේදී හරස් සටහන් මගින් ලැබීම් හා ගෙවීම් ඇතුළත් කිරීම අතපසු වී ඇත.ඒ අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ලැබීම් හා ගෙවීම් සඳහා හරස් සටහන් මගින් ලැබීම් හා ගෙවීම් වටිනාකම ද එකතු විය යුතු බව පිළිගනිමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයනිවරැදිව සකස් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිවයිනේ පවතින පුරන් කුඹුරු "ඵලදායි වාණිජ ඒකක" බවට පත්කිරීමට ලබාදී තිබුණු මුදලින් රු.17,690,000 ක් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදී තිබුණි. මෙහිදී අක්කර 2,500 ක ප්‍රතිලාභීන් 500 ක් වෙනුවෙන් අක්කර 01 කට රු.80,000 ක මුදල් සහනාධාර, රු.150,000 ක ණය ආධාර සහ පොල් පැළ ලබාදීම ඉලක්ක කර තිබුණු අතර වගාකරුවන් 753 ක් අක්කර 959 ක පොල් වගා කිරීමට අයදුම්පත් ලබාදී තිබුණි. පැරණි කුඹුරුවල පොල් වගා කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතුව තිබුණද එම ඉඩම් පරීක්ෂාකර අදාළ අනුමැතීය ලබාදී නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතික්‍රියාත්මක වී නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් ඉල්ලුම් පත්‍ර ගෙන්වා ගෙන මූලික ඉඩම් පරීක්ෂණ සිදු කර ඇති අතර පුරන් කුඹුරුවලපොල් වගාකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණ ද එම ඉඩම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දී නැත. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. |
| (ආ) | කිතුල් ක්ෂේත්‍රය නඟා සිටුවීමට ව්‍යාපෘති 8 ක් ඇතුළත්ව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 11කට අයත්වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 70 ක ප්‍රතිලාභීන් 5093 ක් තෝරාගෙන එම දිස්ත්‍රික් ලේකම් කාර්යාල 11 ක් වෙත රු.65,487,500 ක් මුදල් ලබාදී තිබුණි.2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල11ක් විසින් රු.28,403,882 ක් වියදම් දරා තිබුණු අතර දිස්ත්‍රික්ක 05 ක කිතුල් නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථාන 06 ක් ඉදිකිරීමට | කිතුල් නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කර තිබුණි. මෙම වැය විෂය යටතේ කිතුල් නිෂ්පාදන දිරිගැන්වීම සඳහා දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රතිපාදන වෙන් කර තිබුණි.අක් මුදල් නොලැබීම හේතුවෙන් රු.මිලියන 44.3 අතැති බිල්පත් ඉතිරි වී තිබුණි.එබැවින් මූල්‍ය ප්‍රගතිය අඩු මට්ටමක පැවතිණි. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.21,586,207 ක ප්‍රතිපාදන සපයා තිබුණද, එම ඉදිකිරීම් සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | දේශීය තල් කර්මාන්තය විවිධාංගිකරණය කිරීම සඳහා රු.86,320,000 ක් තල් සංවර්ධන මණ්ඩලයට ලබාදී තිබුණු අතරතල් සංවර්ධන මණ්ඩලයට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මුදලින් රු.22,000,000 ක් ලබාදී තිබුණි. මෙහිදී දේශීය තල් කර්මාන්තය විවිධාංගිකරණය කිරීමට අපේක්ෂිත ඉලක්ක 06 ක් ඇතුළත්වූ අතර එම ඉලක්ක වලින් තල් සම්පත් සංවර්ධනය, තාක්ෂණික පුහුණුව, තල් ආශ්‍රිත නිෂ්පාදනය සහ තල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය යන කාර්යයන් 04 ක් සඳහා පමණක් රු.17,170,000 ක් හෙවත් සියයට 15 ක් වියදම් දරා තිබුණි. එසේම තල් සංවර්ධන මණ්ඩලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම මෙතෙක් ආරම්භ කර නොතිබුණි. | දේශීය තල් කර්මාන්තය සඳහා වෙන්වූ රු. මිලියන 200 ක මුදලින් තල් නිෂ්පාදන යන්ත්‍රසූත්‍රවල පැවති ගැටලු හේතුවෙන් හා ඉඩම් ගැටලු හේතුවෙන් ප්‍රතිපාදන වියදම් දැරීම සීමාවී ඇත. | ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස්කිරීමේදීඉටු කළ හැකි කාර්යභාරය ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතුය. |